## මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත (Japan Tec)

# ආධුනිකයින් බඳවා ගැනීම - 2025 වසර

**අධ්‍යාපන අමාත්‍යාංශය**

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය

**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන ජපන් - ශ්‍රී ලංකා මිත්‍රත්වය මත ජපන් රජය මගින් ප්‍රදානය වූ මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සඳහා **2025** වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම පිණිස වයස අවුරුදු **16** ට නොඅඩු **25** ට නොවැඩි ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.



| | පූර්ණ කාලීන පාඨමාලා | කාලය | පාඨමාලා ගාස්තු (දිවා)* | බඳවා ගැනීමේ සුදුසුකම් |
|---|---|---|---|---|
| 1.1 | මෝටර් රථ කාර්මික ශිල්පී Automobile Technician | අවු. **03** | රු.200,000/- | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම |
| 1.2 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී Automobile Electrician | අවු. **03** | රු.200,000/- | |
| 1.3 | යන්ත්‍ර ශිල්පී Machinist / CNC | අවු. **03** | රු.170,000/- | 2025.01.01 දිනට වයස අවුරුදු 16 ට නොඅඩු සහ 25 ට නොවැඩි ස්ත්‍රී /පුරුෂ දෙපාර්ශවයටම අයදුම්කල හැක. |
| 1.4 | මෝටර් රථ වායු සමීකරණ කාර්මික ශිල්පී Automobile A/C Mechanic | අවු. **02** | රු.70,000/- | |
| 1.5 | මෝටර් රථ ටින්කර් ශිල්පී Automobile Tinker | අවු. **1 ½** | රු.30,000/- | රජයේ හෝ රජය විසින් පිළිගන්නා ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත්වී තිබීම. |
| 1.6 | මෝටර් රථ පින්තාරු ශිල්පී Automobile Painter | අවු. **1 ½** | රු.30,000/- | 2025.01.01 දිනට වයස අවුරුදු 16 ට නොඅඩු සහ 25 ට නොවැඩි ස්ත්‍රී /පුරුෂ දෙපාර්ශවයටම අයදුම්කල හැක. |

*දිවා පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීමෙන් පසු ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය මත අයදුම්කරුවන් අතරින් සීමිත සිසුන් පිරිසක් සඳහා සන්ධ්‍යා කාලීන පාඨමාලා ආරම්භ කෙරෙන අතර ඒ සඳහා 50% ක අමතර පාඨමාලා ගාස්තුවක් අයකෙරේ

### අයදුම්පත් එවිය යුතු ආකාරය

**2024 අගෝස්තු මස 09** වන දින ගැසට් පත්‍රයේ සඳහන් ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පතෙහි පසු පිටෙහි මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දෙමටගොඩ මහජන බැංකු ශාඛාවේ **ගිණුම් අංක 071100103320674 දරණ** ගිණුමට විභාග ගාස්තු ලෙස **රු. 1000.00 ක්** බැර කර ලබාගත් ලදු පත අලවා **(මාර්ගගත ක්‍රමයට හෝ CDM ක්‍රමයට කරන ලද ගෙවීම් වලංගු නොවේ) 2024 සැප්තැම්බර් 11 දිනට හෝ ඊට ප්‍රථම, අධ්‍යක්ෂ / විදුහල්පති, මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, නො.69/A" බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙලවරේ **"ආධුනිකයින් බඳවා ගැනීම - 2025"** යනුවෙන් සඳහන් කළ යුතුය. අප ආයතනයට පැමිණද ඉල්ලුම්පත් නොමිලේ ලබාගත හැකිය. නැතහොත් **www.aeti.edu.lk** හෝ **www.naita.gov.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.



## වැඩිදුර තොරතුරු සඳහා ලේඛකාධිකාරී, දුරකථන අංක

## 011-2572977 හෝ 011-2531844 විමසන්න

**නැතහොත් 2024 අගෝස්තු මස 09 වන දින ගැසට් නිවේදනය බලන්න**

සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
නො. 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය

011 288 782 - 5 naita sri lanka www.naita.gov.lk

tamilguru.lk